යෝජනා සම්මතය

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

ස්වෛරීත්ව ණය තිරසරභාවය නැවත ඇති කිරීමට දේශීය ණය ප්‍රශස්තකරණය ක්‍රියාත්මක කිරීම සඳහා වන යෝජනා සම්මතය

2023 ජූනි 28 දැනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ජනරජයේ දේශීය ණය තිරසරභාවය තහවුරු කිරීමටත්, ශ්‍රී ලංකාවේ මහජනතාව සහ අනාගත පරපුර ප්‍රතිලාභ ලබන තිරසර ආර්ථික වර්ධනය පෙරදැරි කරගත් ආර්ථික ප්‍රකෘතිමත්භාවය වෙත වන වේගවත් සංක්‍රමණය තහවුරු කිරීම සඳහාත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දේශීය ණය ප්‍රශස්තකරණය සඳහා අවශ්‍ය සියලුම අවසර මුදල්, ආර්ථික ස්ථිරීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය තුමාට ලබා දීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

පාර්ලිමේන්තුවේ තවදුරටත් සලකා බැලීම සඳහා පහත ලේඛන මීට අමුණා ඇත.

(අ) 2023 ජූනි 28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සහ එහි තීරණය;

(ආ) ස්වෛරීත්ව ණය තිරසරභාවය නැවත ඇති කිරීමට දේශීය ණය ප්‍රශස්තකරණය ක්‍රියාත්මක කිරීම සඳහා වූ සංකල්ප පත්‍රිකාව; සහ

(ඇ) ලියාපදිංචි කොටස් හා සුරකුම්පත් ආඥාපනත යටතේ වන රෙගුලාසි.